# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2299/46 - 2022 සැප්තැම්බර් මස 28 වැනි බදාදා - 2022.09.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

[යොමුව]

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27(1) හා (5) වගන්ති, 28(2) හා (3) වගන්ති, 64(2) වගන්තිය හා 70 වගන්තිය සමග කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1 මෙම නියෝග 2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝග ලෙස හඳුන්වනු ලැබිය යුතුය.

I කොටස
**26 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ලබාගැනීමේ කාර්ය පරිපාටිය**

2 පනතේ 26වන වගන්තිය ප්‍රකාර කොළඹ වරාය නගරය බල ප්‍රදේශයේ හා එහි සිට ව්‍යාපාර කටයුත්තක් සිදු කිරීමට බලයලත් තැනැත්තෙකු ලෙස සුදුසුකම් ලැබීමේ බලපත්‍රයක් සඳහා වූ අයදුම්පත මෙහි I උපලේඛනය තුළ පනවා ඇති ආකෘතියෙන් විය යුතු අතර, ඒ සමග එම අයදුම්පත තුළ හඳුනාගනු ලබන ලේඛන ඉදිරිපත් කළ යුතුය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3 කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ හා එහි සිට ව්‍යාපාර කටයුත්තක් සිදු කිරීම සඳහා බලයලත් තැනැත්තෙකු ලෙස සුදුසුකම් ලැබීමේ බලපත්‍රයක් සඳහා වූ අයදුම්පතක් කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ හා එහි සිට ව්‍යාපාර කටයුත්තක් සිදු කිරීමට අදහස් කරන පුද්ගලයා විසින් ඉදිරිපත් කළ හැක.

4 අයදුම්පතක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා ගෙවිය යුතුවන ගාස්තුව ගාස්තු නියෝග තුළ පනවා ඇති පරිදි විය යුතුය.

5 (අ) අයදුම්පත හා සහාය ලේඛන තක්සේරු කිරීමෙන් අනතුරුව, පහත සඳහන් කොන්දේසි ඇතුළත්ව බලපත්‍රයක් නිකුත් කිරීමට හෝ ලබාදීමට පෙර සපුරාලිය යුතුවන කොන්දේසිවලට යටත්ව ප්‍රතිපත්තිමය වශයෙන් අයදුම්පත අනුමත කරමින්, ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපියක් කොමිෂන් සභාව විසින් නිකුත් කළ යුතුය:

i අදාළවන ලිඛිත නීති යටතේ සියලු නීතිමය හා නියාමන අවශ්‍යතාවයනට අයදුම්කරු විසින් අනුගත විය යුතු බවට පනවනු ලබන කොන්දේසියක්; හා

ii අයදුම්කරු සමාගමක් නම්, පනතේ VII කොටස යටතේ අයදුම්කරු විසින් ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබාගත යුතු බවට පනවනු ලබන කොන්දේසියක් සහ, අයදුම්කරු අක් වෙරළ බැංකු ව්‍යාපාරයක් නම්, පනතේ VIII කොටස යටතේ අයදුම්කරු විසින් බලපත්‍රයක් ලබාගත යුතු බවට පනවනු ලබන කොන්දේසියක්.

(ආ) අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව යම් අවස්ථාවක අයදුම්පතෙහි I කොටස තුළ අයදුම්කරු විසින් සපයා ඇති විස්තරවල යම් වෙනසක් සිදු වුවහොත්, අයදුම්කරු විසින් එම වෙනස පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතුවන අතර, සංශෝධිත අයදුම්පතක් නැවත ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාව විසින් අයදුම්කරු වෙත අවසර ලබාදිය හැක. එසේ නැවත ඉදිරිපත් කිරීමකදී කොමිෂන් සභාව විසින් අයදුම්පත නැවත සලකා බලා අවශ්‍ය යැයි හැඟෙන තැන්වල ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපිය තුළ දක්වා ඇති කොන්දේසි සංශෝධනය කළ හැක.

(ඇ) (5(ආ) නියෝගය යටතේ සිදුකරනු ලබන යම් සංශෝධන වේනම් ඒවාද ඇතුළත්ව) උක්ත 5(අ) නියෝගය යටතේ නිකුත් කරනු ලබන ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපිය එම ලිපිය තුළ සඳහන් කාල පරිච්ඡේදය සඳහා වලංගු වන අතර එම වලංගු කාලය සුවිශේෂී අවස්ථාවන්හිදී පමණක් කොමිෂන් සභාව විසින් ලිඛිතව දීර්ඝ කළ හැක.

(ඈ) 5(අ) නියෝගය යටතේ ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපිය නිකුත් කිරීම තුළ අයදුම්කරු හට කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීමේ හෝ පවත්වාගෙන යාමේ හිමිකමක් ලබාදෙනු නොලබයි.

(ඉ) 5(අ) නියෝගය යටතේ ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපිය නිකුත් කිරීම මගින් කොමිෂන් සභාව වෙත කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ හෝ එහි සිට ව්‍යාපාරික කටයුතුවල නිරත වීම සඳහා අයදුම්කරු වෙත අවසර ලබා දෙමින් අයදුම්කරුහට බලයලත් තැනැත්තෙකු වශයෙන් වූ සුදුසුකම ලබාදීමේ බලපත්‍රයක් නිකුත් කිරීමේ බැඳීමක් ඇති නොකරනු ඇත.

i. ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපිය තුළ දක්වා ඇති කොන්දේසි කොමිෂන් සභාව විසින් නිර්ණය කළ ආකාරයෙන් සපුරාලනු නොලැබූ; හෝ

ii. අයදුම්කරු බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා පනත යටතේ වූ අවශ්‍යතාවයන් හා අනුගතව කටයුතු කර නොමැති; හෝ

iii. අයදුම්කරු විසින් ලබාදී ඇති බලපත්‍රයක් සඳහා වූ අයදුම්පතෙහි ඇතුළත් යම් තොරතුරක් හෝ ඒ හා සම්බන්ධව ලබාදී ඇති යම් තොරතුරක් ව්‍යාජ හෝ සාවද්‍ය බවට හෙළිදරව් වන අවස්ථාවන්හිදී කොමිෂන් සභාව විසින් එම ලිපිය ඉවත්කර ගැනීම හෝ අයදුම්කරු හට බලයලත් තැනැත්තෙකු වශයෙන් සුදුසුකම් ලබා දෙමින් බලපත්‍රයක් නිකුත් කිරීමෙන් වැළකී සිටීම සිදුකළ හැක.

ඉදින් අයදුම්කරුවෙකු වෙත නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපිය ඉවත්කර ගැනීමට හෝ බලපත්‍රයක් නිකුත් කිරීමෙන් වැළකී සිටීම සඳහා තීරණයක් ගැනීමට පෙර කොමිෂන් සභාව විසින් එසේ ඉවත් කරගැනීමේ හෝ බලපත්‍රයක් නිකුත් කිරීමෙන් වැළකී සිටීමේ තීරණය සඳහා සලකා බලන ලද පදනම්ගත හේතු ප්‍රකාශ කරමින් අයදුම්කරු වෙත ප්‍රමාණවත් ලිඛිත දැනුම්දීමක් සිදුකළ යුතුවන අතර එම අයදුම්කරු හට කොමිෂන් සභාව විසින් සලකා බලනු පිණිස කරුණු ඉදිරිපත් කිරීමට හා වැඩිදුර ලේඛන හෝ තොරතුරු වේනම් ඒවා ඉදිරිපත් කිරීමටද අවස්ථාව ලබාදිය යුතුවේ.

(ඊ) කොමිෂන් සභාව විසින් 5(ආ) නියෝගය යටතේ සාදන ලද සංශෝධන, 5(ඇ) නියෝගය යටතේ අදාළ ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපියේ වලංගු කාල සීමාව දීර්ඝ කරන ලද බවට කරන ලද යම් සන්නිවේදනයක් වේනම් එහි පිටපතක් හා 5(ඉ) නියෝගය යටතේ ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපිය ඉවත් කරන ලද බවට වූ නිවේදනයේ පිටපතක්ද ඇතුළත්ව) 5(අ) නියෝගය යටතේ නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපියේ පිටපතක් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් හා අදාළ නීති ප්‍රකාර අනුමැතිය ලබාගත යුතුවන වෙනයම් අදාළ නියාමන අධිකාරියක් වේනම් එය වෙතද යැවීමට කටයුතු කළ යුතුය.

6. කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ යම් ව්‍යාපාර කටයුත්තක නියැළීම, ආයෝජනය කිරීම, පදිංචි වීම හෝ සේවා නියුක්තිය පිණිස අදාළ ලිඛිත නීති ප්‍රකාර අයදුම්කරු වෙත නියාමන අධිකාරියක් වෙතින් නියාමන ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හා/හෝ වෙනත් අනුමැතියක් අවශ්‍ය වන අවස්ථාවකදී, අයදුම්කරු විසින්, අවශ්‍ය සහාය ලේඛන හා අදාළ ගාස්තුද සමගින් අදාළ ලිඛිත නීතිය තුළ නිර්දේශිත පරිදි එකී ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබාදීම හා / හෝ වෙනත් අනුමැතිය සඳහා අදාළ අයදුම්පත/අයැදුම්පත් තනි කවුළු ආයෝජන පහසුකම් සපයන්නා වශයෙන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. කොමිෂන් සභාව විසින්, 5(ඊ) නියෝගය ප්‍රකාර ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපියද සමගින්, එකඟතාවය / තීරණය ලබාගනු පිණිස අයදුම්පත / අයැදුම්පත් අදාළ නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

7. කොමිෂන් සභාව විසින්, අදාළ පරිදි, අයදුම්කරු උදෙසා හෝ ඔහු වෙනුවෙන් අදාළ නියාමන අධිකාරිය වෙතින් ලද හෝ අයදුම්කරු වෙතින් ලද නියාමන ලියාපදිංචි වීම්, බලපත්, බලය ලබාදීම් හා සෙසු අවශ්‍ය අනුමැතීන්හි පිටපත් තබාගත යුතුය.

8. (අ) ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපියේ සඳහන් කාල පරිච්ඡේදය තුළ නිසි පරිදි අදාළ සියලු ලිඛිත නීතිවල හා නියෝගයන්හි පවත්නා සියලු නීතිමය හා නියාමන අවශ්‍යතාවයනට අනුව කටයුතු කර ඇති අතර, ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපියේ පනවා ඇති සියලු කොන්දේසි සපුරා ඇති බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වන අවස්ථාවේදී, කොමිෂන් සභාව විසින් පැනවිය හැකි නියමයනට හා කොන්දේසිවලට යටත්ව, අයදුම්කරු වෙත බලයලත් තැනැත්තෙකු වශයෙන් සුදුසුකම් ලබා දෙමින් හා අයදුම්කරු හට කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ හා එහි සිට ව්‍යාපාරික කටයුතුවල නිරත වීම සඳහා අවසර ලබා දෙමින් කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් නිකුත් කළ යුතුය.

(ආ) 8(අ) නියෝගය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් එය නිකුත් කළ දින සිට මාස දොළහ(12)ක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු වනු ඇත.

(ඇ) උක්ත 8(අ) ඡේදය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රය තුළ -:

i. කොමිෂන් සභාව විසින් ලබාදී ඇති බලපත් අංකය;
ii. බලපත්ලාභියාගේ නම;
iii. බලපත්ලාභියාගේ නෛතික ස්වරූපය;
iv. බලපත්ලාභියාට අදාළ පදිංචි රටේ, පුරවැසිභාවයේ, සංස්ථාපනයේ, ලියාපදිංචියේ හෝ ස්ථාපනයේ ලිපිනය හා කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ ලිපිනය හෝ පනතේ 64වන වගන්තිය ප්‍රකාර ලිපිනය;
v. කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ හෝ එහි සිට බලයලත් තැනැත්තා හට නියැළීම පිණිස අවසර ලබාදී ඇති ව්‍යාපාරය;
vi. බලපත්‍රය නිකුත් කළ දිනය;
vii. එම බලපත්‍රය නිකුත් කිරීමේදී යටත්වන නියමයන් හා කොන්දේසි
නිශ්චිතව දැක්විය යුතුවන අතර, එය,
viii. II උපලේඛනය තුළ දක්වා ඇති ආකෘතියෙන් පැවතිය යුතුය.

(ඈ) බලපත්‍රය නිකුත් කිරීමෙන් අනතුරුව, කොමිෂන් සභාව විසින් පනතේ 32 වගන්තිය ප්‍රකාර බලයලත් තැනැත්තා සමග එකඟතාවයකට එළැඹ පනතේ 28(4) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනයේ බලයලත් තැනැත්තා පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතුවන අතර, කෙසේ වුවද, පනත හා ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද නියෝග ප්‍රකාර බලයලත් තැනැත්තාගේ ව්‍යාපාරය ක්‍රමෝපායික වැදගත්කමකින් යුත් ව්‍යාපාරයක් වශයෙන් හඳුනාගනු ලැබුවහොත්, පනතේ 53(3) වගන්තිය ප්‍රකාර ගැසට් නිවේදනය තුළ නියෝගය පළ කිරීමෙන් අනතුරුව එකී ගිවිසුමට එළැඹිය යුතුය.

## II කොටස
### *පොදු කොන්දේසි*

**රෙජිස්ටරය**

9. සියලු බලයලත් තැනැත්තන් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනය කොමිෂන් සභාව විසින් නිර්ණය කරනු ලබන ඉමක් දක්වා මහජනතාවට විවෘත විය යුතුය.

10. අයදුම් කරනු ලැබ ගාස්තු නියෝග තුළ නිර්දේශ කර ඇති ගාස්තු ගෙවීමෙන් අනතුරුව, මහජනතාවට තොරතුරු ලබාගත හැකි යම් නිශ්චිත බලයලත් තැනැත්තෙකු සම්බන්ධයෙන් ලේඛනයේ පවත්වාගෙන යනු ලබන තොරතුරුවල උද්ධෘතයක් කොමිෂන් සභාව විසින් ලබාදෙනු ඇත. එසේ නිකුත් කරනු ලබන තොරතුරු උද්ධෘතය එතුළ ප්‍රකාශිත කරුණු සම්බන්ධ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වනු ඇත.

11. අයදුම් කරනු ලැබ ගාස්තු නියෝගය තුළ නිර්දේශිත ගාස්තුව ගෙවීමෙන් අනතුරුව, කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාව නිකුත් කළ බලපත්‍රයක, ලියාපදිංචි සහතිකයක, බලය පැවරීමක හෝ වෙනත් බලයලත් තැනැත්තෙකු අනුමත කිරීමක සහතික කළ පිටපතක් නිකුත් කළ යුතුය. ලබාදෙනු ලබන එවන් බලපත්‍රයක්, ලියාපදිංචි සහතිකයක්, බලය පැවරීමක් හෝ වෙනත් නිකුත් කරනු ලබන අනුමැති පිටපතක් බලයලත් තැනැත්තාට අදාළව බලපත්‍රයක් ලබාදීම, ලියාපදිංචි කිරීම, බලය ලබාදීම හෝ අනුමත කිරීම සම්බන්ධ තීරණාත්මක සාක්ෂියක් විය යුතුය.

**කොළඹ වරාය නගරය බල ප්‍රදේශය ඇතුළත බලයලත් තැනැත්තාගේ කාර්යාලය**

12. මෙහි III කොටසේ නියෝගයනට යටත්ව බලයලත් තැනැත්තාගේ කාර්යාලය පවත්නා ස්ථානය කොළඹ වරාය නගරය බල ප්‍රදේශය ඇතුළත පිහිටි ස්ථානයක් විය යුතු අතර එම ලිපිනය බලයලත් තැනැත්තා වෙත ලිපිනගත කෙරෙන සියලු සන්නිවේදනයන් හා නිවේදනයනට අදාළ ලිපිනය විය යුතුය. කාර්යාල ලිපිනයේ යම් වෙනසක් වුවහොත් එය 15 නියෝගය ප්‍රකාර කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතුය.

**සන්නිවේදන විස්තර**

13. බලයලත් තැනැත්තාගේ නම, එහි කාර්යාල ලිපිනය, බලපත්‍රයේ / බලපත්‍රවල අංකය, (ඇත්නම්) ලියාපදිංචි කිරීමේ සහතිකය හා එම බලයලත් තැනැත්තාගේ බලයලත් අත්සන්කරුගේ නම එහි සියලු නිල සන්නිවේදනයන් තුළ පැහැදිලි අකුරින් සඳහන් විය යුතුය.

14. බලයලත් තැනැත්තෙකු විසින් කරනු ලබන සන්නිවේදනයන් තුළ කිසිදු ආකාරයක නොමඟ යවන සුළු හෝ රැවටිලිකාරී තොරතුරු ඇතුළත් නොවිය යුතුය.

**බලයලත් තැනැත්තෙකු බවට පත්වීමෙන් අනතුරුව අයදුම්පතෙහි විස්තර වෙනස් කිරීම හෝ විවර්තනය.**

15. (අ) ඉදිරිපත් කරනු ලබන අයදුම්පතෙහි දැක්වෙන විස්තර අතරින් යම් කිසිවක වෙනස් කිරීමක් හෝ විවර්තනයක් සිදුවුවහොත්, බලයලත් තැනැත්තා විසින්, එම වෙනස් කිරීමට හෝ විවර්තනයට සාක්ෂි වශයෙන් අවශ්‍ය ලේඛනද සමගින් එම වෙනස් කිරීම හෝ විවර්තනය සිදුවීමෙන් දින තිහ (30)ක් ඇතුළත උපලේඛනය III හි දක්වා ඇති ආකෘති පත්‍රය ඉදිරිපත් කිරීමෙන් එම වෙනස් කිරීම හෝ විවර්තනය ලිඛිතව කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතුය.

(ආ) උක්ත 15(අ) නියෝගය ප්‍රකාර නිවේදනය ලැබීමෙන් අනතුරුව, කොමිෂන් සභාව විසින්, ගාස්තු නියෝග තුළ දක්වා ඇති නිර්දේශිත ගාස්තුව ගෙවීමෙන් පසු, ලේඛනය තුළ අවශ්‍ය වෙනස්කම් සිදුකළ යුතු අතර, අවශ්‍ය තැන්හි, බලයලත් තැනැත්තාගේ නව විස්තරද සහිතව උක්ත නියෝගය 8 යටතේ ලබාදුන් බලපත්‍රය නැවත නිකුත් කළ යුතුය. ජාතික අභිලාශය සලකා බලමින් හෝ ජාතික ආර්ථික ප්‍රගමණය උදෙසා එම වෙනස් කිරීමේ හෝ විවර්තනයේ බලපෑම තක්සේරු කිරීමෙන් අනතුරුව අවශ්‍ය යැයි හඟින්නේ නම්, අන්‍යෝන්‍ය එකඟතාවය මත, කොමිෂන් සභාවට කොමිෂන් සභාව හා බලයලත් තැනැත්තා අතර වූ ගිවිසුමේ යම් නියමයන් හා කොන්දේසි වෙනස් කළ හැක.

(ඇ) අවශ්‍ය යැයි හඟින අවස්ථාවන්හිදී කොමිෂන් සභාව විසින් අයදුම්පතක දක්වා ඇති විස්තර වෙනස් කිරීමට හෝ විවර්තනයට අදාළ නිවේදනය අදාළ නියාමන අධිකාරියක් වෙත ඉදිරිපත් කළ යුතුය.

**මූල්‍ය ප්‍රකාශන හා ගිණුම්කරණ වාර්තා**

16. (අ) මාර්තු මස 31වන දිනෙන් අවසන් වන සෑම මාස දොළහ (12)ක කාල පරිච්ඡේදයක් හෝ අදාළ අවස්ථාවන්හිදී කොමිෂන් සභාව හෝ වෙනත් නියාමන අධිකාරියක් සමඟින් එකඟ වන වෙනත් මාස දොළහ (12)ක කාල පරිච්ඡේදයක් සඳහාම කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ හා එහි සිට සිදුකරනු ලබන ව්‍යාපාර කටයුතුවලට අදාළ ලාභ හා ආදායම්හි අදාළ කොටස වෙන්ව හඳුනාගනු පිණිස සෑම බලයලත් තැනැත්තෙකු විසින්ම මූල්‍ය ප්‍රකාශන පවත්වාගෙන යාම හා සකස් කිරීම සිදුකළ යුතුය. මූල්‍ය ප්‍රකාශන බලයලත් තැනැත්තෙකු විසින් සකස් කරනු ලැබ, විගණකවරයෙකු විසින් විගණනය කරනු ලැබ, බලයලත් අත්සන්කරුවෙකු විසින් අනුමත කොට අත්සන් කරනු ලැබ මාර්තු මස 31වන දිනෙන් හෝ අදාළ පරිදි එකී වෙනත් මාස දොළහක (12) කාල පරිච්ඡේදය අවසන් වීමෙන් මාස හයක් (6) ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) සෑම බලයලත් තැනැත්තෙකු විසින්ම:

i. කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ හා එහි සිට සිදු කෙරෙන බලයලත් තැනැත්තාගේ ගනුදෙනු නිවැරදිව සටහන්වන හා විස්තරවන;

ii. සැලකිය යුතු නිරවද්‍යතාවයකින් යුතුව ඕනෑම අවස්ථාවක බලයලත් තැනැත්තාගේ මූල්‍ය තත්ත්වය නිර්ණය කිරීමේ හැකියාව ලබාදෙන;

iii. ඕනෑම අවස්ථාවක එහි නිලධාරීන් හෝ කළමනාකරුවන් හට නිසි පරිදි විගණනය කළ හැකිවන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ හැකියාව ලබාදෙන

ගිණුම්කරණ සටහන් පවත්වාගත යුතුය.

(ඇ) ගිණුම්කරණ වාර්තා:

i. කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ බලයලත් තැනැත්තාගේ කාර්යාලය තුළ තබාගත යුතුය;

ii. ඒවා සාදන ලද දිනයෙන් අවම වශයෙන් වසර දහය (10)ක කාල පරිච්ඡේදයක් දක්වා බලයලත් තැනැත්තා විසින් සංරක්ෂණය කළ යුතුය; හා

iii. යුක්ති සහගත සෑම අවස්ථාවන්හිදීම විගණකවරයෙකු හා කොමිෂන් සභාව විසින් පරීක්ෂාකර බැලීම සඳහා විවෘතව පැවතිය යුතුය.

**වාර්ෂික විස්තර වාර්තාව**

17. සෑම බලයලත් තැනැත්තෙකු විසින්ම, මාර්තු මස 31වන දිනෙන් අවසන් වන සෑම මාස දොළහ (12)ක කාල පරිච්ඡේදයක් හෝ කොමිෂන් සභාව සමග එකඟ වූ වෙනත් මාස දොළහ (12)ක කාල පරිච්ඡේදයක්ම අවසන, උක්ත 16 නියෝගය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමෙන් දින තිහ (30)ක් ඇතුළත, මෙහි උපලේඛනය **IV** තුළ දක්වා ඇති ආකෘතියෙන් හා එම කරුණු අඩංගු වාර්ෂික විස්තර වාර්තාවක් කොමිෂන් සභාව වෙත භාරදිය යුතුය.

## III කොටස
### *64 වගන්තිය යටතේ අතුරු විධිවිධාන*

18. කොළඹ වරාය නගරය බල ප්‍රදේශයෙන් පිටත ශ්‍රී ලංකාවේ පිහිටි අනුමත, නම් කරන ලද ස්ථානයක ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා බලයලත් තැනැත්තෙකු වෙත අවසර ලබා දීමේදී, කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ පිහිටි රජයේ අලෙවි කළ හැකි ඉඩමක් හෝ ව්‍යාපෘති සමාගමක අලෙවි කළ හැකි ඉඩමක් හෝ ඒ තුළ පවත්නා සහාධිපත්‍ය කොටස් ඒකක් හෝ කිහිපයක් බදු දීමේදී හෝ කොළඹ වරාය නගරය බල ප්‍රදේශය ඇතුළත පවත්නා සහාධිපත්‍ය කොටස් ඒකක් හෝ කිහිපයක් අත්පත් කරගැනීමේදී සිදු කිරීමට යෝජිත ආයෝජන කර්තව්‍යය හා ඒ වෙනුවෙන් පනවනු ලැබ ඇති කාල පරිච්ඡේදය සැලකිල්ලට ගත යුතුවේ.

19. මෙම III කොටස යටතේ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති අවසරය ලිඛිතව ලබා දී තිබිය යුතු අතර, කොළඹ වරාය නගර බල සීමාවෙන් පිටත නම් කරන ලද අනුමත ස්ථානයක් තුළ හා වෙතින් යම් බලයලත් තැනැත්තෙකු වෙත ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසර ලබාදී ඇති මූල්‍ය තොරතුරු ලබාදීම හා වාර්තාකරණය වැනි කරුණු පිළිබඳ කොන්දේසිද එතුළ ඇතුළත් විය හැක.

20. අවසර ලත් කාල සීමාව තුළ කොළඹ වරාය නගරය බල ප්‍රදේශයෙන් පිටත ශ්‍රී ලංකාව තුළ අනුමත නම්කරන ලද ස්ථානයේ ලිපිනය නියෝගය 12 හි අවශ්‍යතාවයන් සඳහා බලයලත් තැනැත්තා වෙත සියලු සන්නිවේදනයන් හා දැනුම් දීම් ලිපිනගත කරනු ලබන ලිපිනය විය යුතුය.

## IV කොටස
### *බලපත්‍ර, ලියාපදිංචි කිරීම්, බලය පැවරීම් හා සෙසු අනුමැතීන්හි කාලය දීර්ඝ කිරීම*

21. (අ) පහත 21(ඇ)නියෝගයට යටත්ව, අයදුම්කරු වෙත බලයලත් තැනැත්තෙකු වශයෙන් සුදුසුකම් ලබා දෙමින් කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ හා එහි සිට ව්‍යාපාරික කටයුතුවල නිරත වීමට අයදුම්කරු වෙත අවසර ලබාදෙමින් නිකුත් කරනු ලබන බලපත්‍රය ලබාගැනීමට අපේක්ෂා කරන සෑම බලයලත් තැනැත්තෙකු විසින්ම බලපත්‍රය කල් ඉකුත් වීමට දින තිහ (30)කට පෙර එය අලුත් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත උපලේඛනය V තුළ දක්වා ඇති ආකෘතියෙන් ලිඛිතව අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ආ) අයදුම්කරු විසින්, අවශ්‍ය සහාය ලේඛන හා අදාළ ගාස්තු හා අයකිරීම්ද සහිතව, අදාළ නීතිය මගින් නිර්දිශ්ට ආකෘතියෙන්, අදාළ නීතියෙන් නියම කර ඇති යම් වෙනත් ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය පැවරීමක් හා/හෝ අනුමැතියක් ලබාගනු පිණිස, අදාළ තනි කවුළු ආයෝජන පහසුකම් සපයන්නා වන කොමිෂන් සභාව වෙත අදාළ අයදුම්පත/ අයැදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) බලපත්ලාභියා වෙත බලයලත් තැනැත්තෙකු ලෙස සුදුසුකම් ලබාදෙන අයුරු බලපත්‍රය අලුත් කිරීම සඳහා ප්‍රමාද වී ඉදිරිපත් කරනු ලබන අයැදුම්පත්‍රයක්:

i. එය කල් ඉකුත් වීමෙන් දින තිහ (30)ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු අතර, බලපත්‍රය ලබා දුනහොත් එමගින් පෙර බලපත්‍රයෙන් ලබාදුන් අවසරය නොකඩවා ඉදිරියට පැවැත්වෙන බවට සැලකෙන අතර කිසිදු දඩ මුදලක් නොපැනවෙනු ඇත; හෝ

ii. එය කල් ඉකුත් වීමෙන් දින තිහ (30)ක් ගතවීමෙන් අනතුරුව ඉදිරිපත් කළ යුතු අතර, බලපත්‍රය ලබා දුනහොත් එමගින් පෙර බලපත්‍රයෙන් ලබාදුන් අවසරය නොකඩවා ඉදිරියට පැවැත්වෙන බවට සැලකෙන අතර, නියෝගය 31 තුළ දක්වා ඇති පරිදි දඩ මුදලක් පැනවෙනු ඇත.

22. බලපත්ලාභියා වෙත බලයලත් තැනැත්තෙකු වශයෙන් වූ සුදුසුකම් ලබා දෙමින් බලපත්‍රය අලුත් කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමේදී, බලපත්ලාභියා විසින් පහත තොරතුරු තහවුරු කරමින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය:

(අ) වාර්ෂික විස්තර වාර්තාව තුළ දක්වා ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරදිව පවත්නා අතර, වාර්ෂික විස්තර වාර්තාව ගොනු කිරීමෙන් අනතුරුව 15 නියෝගය ප්‍රකාර වෙනස් කිරීම් සිදු කරනු ලැබ ඇති තැන්හිදී, එම වෙනස් කිරීම් පිළිබඳව කොමිෂන් සභාව නිසි පරිදි දැනුවත් කොට ඇති බවට;

(ආ) එහි සඳහන් පදිංචිය, පුරවැසිභාවය, සංස්ථාපනය, ලියාපදිංචිය හෝ පිහිටුවීමට අදාළ රට තුළ අදාළ නීතිය ප්‍රකාර සැම කල්හිම බලයලත් තැනැත්තා නුබුන්වත්ව සිට ඇති අතර, අදාළ පරිදි බුන්වත්භාවය හෝ බංකොලොත්භාවය හෝ වෙනත් අදාළ නීතියකට අදාළව කිසිදු නීතිමය කර්තව්‍යයකට යටත්ව නොසිටින බවට; හා

(ඇ) එය එයට අදාළ සියලු (නියාමන හෝ වෙනත්) නීති හා සියලු බලපත්කරණ ගාස්තු හා අනුගත වන බවට.

23. අලුත් කිරීම සඳහාවන අයදුම්පත සහ නියෝගය 22හි සඳහන් තහවුරු කිරීමේ ප්‍රකාශය ලැබීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාදෙනු ලබන නිර්දේශ මත හා ගාස්තු නියෝග තුළ දක්වා ඇති නියමිත ගාස්තුවක් ගෙවීමෙන් පසු හා ගාස්තු නියෝග යටතේ අවශ්‍ය විය හැකි වාර්ෂික ගාස්තුවක් ගෙවීමෙන් පසු, කොමිෂන් සභාව විසින් බලපත්ලාභියා වෙත බලයලත් තැනැත්තෙකු වශයෙන් වූ සුදුසුකම් ලබා දෙමින් අලුත් කරන ලද බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය.

24. බලපත්‍රලාභියෙකු එම බලපත්‍රලාභියා වෙත බලයලත් තැනැත්තෙකු වශයෙන් සුදුසුකම් ලබා දෙමින් නිකුත් කරන ලද බලපත්‍රය මෙහි IV කොටස තුළ දක්වා ඇති අයුරින් එහි කල් ඉකුත්වන දින සිට දින හතලිස් පහ (45)ක් ඇතුළත අලුත් කිරීමට අපොහොසත් වුවහොත්, බලපත්‍රය කල් ඉකුත්වූ දින සිට එම පුද්ගලයා කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ හා එහි සිට ව්‍යාපාර කටයුතුවල නියැළීම සඳහා බලයලත් තැනැත්තෙකු වීම අවසන් වනු ඇත.

## V කොටස

*බලපත්‍ර හුවමාරු කිරීම හා පැවරීම*

25. බලයලත් තැනැත්තෙකු වශයෙන් සුදුසුකම් ලබාදීම සඳහා නිකුත් කරන ලද බලපත්‍රය හුවමාරු නොකළ යුතු අතර අන් කිසිදු පාර්ශ්වයකට පැවරිය නොහැක.

## VI කොටස

*බලපත්‍රය අත්හැරීම, අත් හිටුවීම, ප්‍රත්‍යාදිෂ්ට කිරීම හා අවලංගු කිරීම*

26. අත්හැරීම

(අ) මෙහි 26 නියෝගයෙහි අවශ්‍යතාවයන් ප්‍රකාර අදාළ බලපත්‍රය අත් හැරීම උදෙසා වූ අයැදුමක් සිදුකොට ඇත්තේ නම්, කොමිෂන් සභාව විසින් බලපත්ලාභියා වෙත බලයලත් තැනැත්තෙකු ලෙස සුදුසුකම් ලබා දෙමින් නිකුත් කරන ලද බලපත්‍රය අහෝසි කළ හැක.

(ආ) අයදුම්පත:

i. බලයලත් තැනැත්තා විසින් හෝ බලයලත් තැනැත්තා වෙනුවෙන් බලයලත් අත්සන්කරු විසින් ඉදිරිපත් කළ යුතුය; හා

ii. උපලේඛනය VI තුළ දක්වා ඇති ආකෘතියෙන් විය යුතුය.

(ඇ)

i. බලයලත් තැනැත්තා විසින් පසුගිය මාස තුන (3) ඇතුළත කවර අවස්ථාවක හෝ:

අ. සිය නාමය වෙනස් කොට ඇත්තේ නම්;

ආ. වෙළඳාම් කිරීම හෝ වෙනත් ආකාරයකින් ව්‍යාපාර කටයුතුවල නිරතවීම සිදු කොට ඇත්තේ නම්;

ඇ. බලයලත් තැනැත්තාගේ කටයුතු අවසන් කිරීම උදෙසා 26 නියෝගය යටතේ අයැදුමක් සිදු කිරීමේ කාර්යය සඳහා හෝ අදාළ නීතිමය අවශ්‍යතාවය හා අනුගත වීම උදෙසා අවශ්‍ය හෝ සුදුසු වන ඒවා හැර අන් කිසිදු කටයුත්තක නිරතව සිටියේ නම්; හෝ

ii. අදාළ බුන්වත්බව සම්බන්ධ හෝ බංකොලොත්බව සම්බන්ධ හෝ වෙනයම් අදාළ නීතියකට අනුව බලයලත් තැනැත්තා හෝ එහි දේපළ සම්බන්ධයෙන් යම් නීති කෘත්‍යයක් ආරම්භ කොට ඇති අවස්ථාවක,

මෙම 26 නියෝගය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කිරීමට බලයලත් තැනැත්තෙකු හිමිකම් නොලබනු ඇත;

(ඈ) කොමිෂන් සභාව වෙත දැනුම් දීම මගින් 26(ආ) නියෝගය යටතේ වූ අයදුම්පතක් ඉවත් කරගත හැක.

(ඉ) (i) කොමිෂන් සභා වෙබ් අඩවියේ, (ii) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ගැසට් පත්‍රයේ හා (iii) සිය බලපත්‍රය අවලංගු කිරීමේ බලය ක්‍රියාත්මක කරමින් ලියාපදිංචි ලේඛනයෙන් බලයලත් තැනැත්තෙකුගේ නම කපා හැරිය හැකි බව ප්‍රකාශ කරමින් ඕනෑම පුද්ගලයෙකු හට එසේ කටයුතු නොකළ යුත්තේ මන්ද යන්නට හේතු දක්වන ලෙස ආරාධනා කරමින් ශ්‍රී ලංකාව තුළ බෙදා හරිනු ලබන දිනපතා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පතක කොමිෂන් සභාව විසින් නිවේදනයක් පළ කරනු ලැබීමෙන් මාස තුන (3)ක් ඉක්ම යන තෙක් මෙම 26 නියෝගය යටතේ කොමිෂන් සභාවට බලපත්‍රය අවලංගු කළ නොහැක.

**අවලංගු කිරීම**

27. (අ) පහත සඳහන් කවර හෝ සිදුවීමක් බලයලත් තැනැත්තෙකු විසින් සිදුකරනු ලබන ප්‍රමාණාත්මක පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් ලෙස සැලකෙනු ඇත.

i. බලපත්ලාභියා වෙත බලයලත් තැනැත්තෙකු ලෙස වූ සුදුසුකම ලබා දෙමින් බලපත්‍රය නිකුත් කිරීමෙන් මාස හයක් (6) ඇතුළත ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට අපොහොසත් වීම;

ii. සිය ණය ගෙවීමේ නොහැකියාවද ඇතුළත් යම් හේතුවක් මත අදාළ බුන්වත් බවට, බංකොලොත් බවට සම්බන්ධ හෝ වෙනත් අදාළ නීතියක් ප්‍රකාර බලයලත් තැනැත්තා, හෝ එහි දේපළ සම්බන්ධයෙන් යම් නඩු කටයුත්තක් ආරම්භ කිරීමෙන් අනතුරුව බලයලත් තැනැත්තා බුන්වත් හෝ බංකොලොත් බවට නිසි අධිකරණ බලයක් සහිත අධිකරණයක් විසින් විනිශ්චය කරනු ලැබීම;

iii. අවසර ලත් ස්ථාන(ය) හෝ ප්‍රදේශය ඇතුළත ව්‍යාපාර කටයුතු සිදු කිරීම නතර කිරීම;

iv. බලයලත් තැනැත්තා හට සිය ව්‍යාපාරික මෙහෙයුම් හෝ කටයුතු පවත්වාගෙන යාම සඳහා වූ හැකියාවට බලපෑමක් ඇති කෙරෙන පරිදි නියාමන අධිකාරියක් විසින් ලබාදුන් යම් ද්‍රව්‍ය නියාමන බලපත්‍ර, ලියාපදිංචි කිරීම්, බලය ලබාදීම් හෝ සෙසු අනුමැතීන් අවලංගු කිරීම හෝ, විදේශීය නියාමන අධිකාරියක් හෝ පාලන ආයතනයක් විසින් ලබාදෙනු ලබන බලපත්‍රයක්, ලියාපදිංචියක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමැතියක් පදනම් කරගනිමින් කොමිෂන් සභාව විසින් බලයලත් තැනැත්තෙකු වශයෙන් වූ බලපත්‍රය ලබාදෙනු ලබන තැනෙකදී, විදේශීය නියාමන අධිකාරිය හෝ පාලන ආයතනය විසින් ලබාදෙනු ලබන එම බලපත්‍රය, ලියාපදිංචිය, බලය ලබාදීම හෝ වෙනත් අනුමැතිය අවලංගු කිරීම;

v. අදාළ නීතිය ප්‍රකාර බලයලත් තැනැත්තා වෙත පවත්නා නෛතික බලාධිකාරිය නතර වන අවස්ථාව;

vi. කොමිෂන් සභාවේ අදහසට අනුව බලපත්‍රය නිකුත් කිරීමට පාදක වන විස්තර හා අනනුගත හෝ ගැටෙන සුළු ලෙස බලයලත් තැනැත්තෙකුට අදාළ විස්තරවල සැලකිය යුතු වෙනස් වීමක් සිදුව ඇති විටෙක;

vii. පනතේ යම් විධිවිධානයකට හෝ වාර්ෂික ගාස්තු, අලුත් කිරීමේ ගාස්තු, දණ්ඩන හෝ දඩ මුදල් ගෙවීමට අපොහොසත් වීමද ඇතුළත්ව යම් රෙගුලාසියක්, නියමයක්, විධානයක්, නියෝගයක් හෝ අදාළ විය හැකි පරිදි පනත යටතේ පනවා ඇති සෙසු අවශ්‍යතාවයකට පටහැනිව කටයුතු කිරීම;

viii. කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති බලපත්‍රයේ නියමයන් හා කොන්දේසි කඩ කිරීම;

ix. පනතේ 32 වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාව සමග ක්‍රියාත්මක කරන ලද නියමයන් හා කොන්දේසි කඩ කිරීම;

x. බලපත්‍රය, ලියාපදිංචිය, බලය ලබාදීම හෝ අනුමැතිය පිණිස වූ අයදුම්පත සම්බන්ධව කොමිෂන් සභාව වෙත සාවද්‍ය, නොමඟ යවන සුළුවූ හෝ ව්‍යාජ තොරතුරු හෝ ලේඛන ලබාදීම; හෝ

xi. කොමිෂන් සභාවේ අදහසට අනුව කොළඹ වරාය නගරය බල සීමාවේ සුභ සිද්ධියට, ජාතික සුභ සිද්ධියට හා ජාතික ආර්ථිකයට හානිකර විය හැකි ආකාරයකින් ව්‍යාපාර කටයුතු සිදු කිරීම.

(ආ) 27 (අ) (i),(ii), (iii), (iv), (v) හා (vi) නියෝග තුළ හඳුනාගනු ලැබ ඇති යම්කිසි සිදුවීමක් සිදුවූ වහාම එම සිදුවීම පිළිබඳ බලයලත් තැනැත්තා විසින් ලිඛිතව කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතුය.

28. (අ) බලයලත් තැනැත්තෙකු විසින් සැලකිය යුතු පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් සිදු කරන හෝ උක්ත 27(ආ) නියෝගය ප්‍රකාර සැලකිය යුතු පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම් දෙන විටකදී, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අදාළ හේතුද සමගින් එම බලයලත් තැනැත්තා වෙත නිකුත් කොට ඇති බලපත්‍රය අවලංගු කිරීම සඳහා වූ සිය අදහස ලිඛිතව බලයලත් තැනැත්තා වෙත නිවේදනය කළ යුතුය.

(ආ) අදාළ නිවේදනය ලැබීමෙන් දින තිහ (30)ක් ඇතුළත එම බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්ද යන්නට හේතු දක්වමින් 28(අ) නියෝගය යටතේ වූ අපේක්ෂිත අවලංගුකරණ නිවේදනයට එරෙහිව බලයලත් තැනැත්තා හට කොමිෂන් සභාව වෙත ලිඛිත විරෝධතා ඉදිරිපත් කළ හැක.

(ඇ) යම් විරෝධතා පවත්තේ නම් ඒවා සැලකිල්ලට ගැනීමෙන් පසු හා සිය විරෝධතාවනට පක්ෂව බලයලත් තැනැත්තා දක්වන කරුණු විභාග කොට බැලීමෙන් අනතුරුව, කොමිෂන් සභාව විසින් නිර්ණය කළ යුතුවන කාර්ය පරිපාටියකට අනුව කොමිෂන් සභාව විසින් කොන්දේසි සහිතව හෝ රහිතව 28(අ) නියෝගය යටතේ ලබාදෙන ලද නිවේදනය ඉවත් කරගැනීම හෝ බලපත්‍රලාභියා හට බලයලත් තැනැත්තෙකු ලෙසවූ සුදුසුකම් ලබා දෙමින් නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම සිදුකළ හැකි අතර, ඒ අනුව බලයලත් තැනැත්තා ලිඛිතව දැනුවත් කළ යුතුය. මෙහි දක්වා ඇති නියමයන් ප්‍රකාර වූ අවලංගු කිරීමේ නිවේදනය කොමිෂන් සභාව විසින් අදාළ සියලු නියාමන අධිකාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඈ) මෙම 28 නියෝගය යටතේ බලයලත් තැනැත්තෙකුගේ බලපත්‍රයක් අවලංගු කිරීම 28(ඇ) නියෝගය ප්‍රකාර නිකුත් කෙරෙන නිවේදනය තුළ දක්වා ඇති දිනයෙහි ක්‍රියාත්මක විය යුතුය.

(ඉ) 28(ඇ) නියෝගය යටතේ බලයලත් තැනැත්තෙකුගේ බලපත්‍රයක් අවලංගු කිරීමේ කාර්යයක් ක්‍රියාත්මකව පවත්නා විටෙකදී, කොමිෂන් සභාව විසින්, හැකි විගස, (i) කොමිෂන් සභා වෙබ් අඩවියෙහි, (ii) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ගැසට් පත්‍රයෙහි, හා (iii) ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි දිනපතා පුවත්පතක එකරුණ පළ කළ යුතුය.

29. 28(ඇ) නියෝගය යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් අවලංගු කිරීමේ නිවේදනයක් නිකුත් කර ඇති විටෙකදී, කොමිෂන් සභාව විසින් බලයලත් තැනැත්තා වෙත අවලංගු කිරීමේ නිවේදනය නිකුත් කළ දින සිට -

(අ) අදාළ විධානය තුළ පනවා ඇති යම් ආකාරයකින් සිය වත්කම් සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ වත්කම් බැහැර කිරීම ඒ වෙත තහනම් කරමින්;

(ආ) එසේ පනවනු ලබන යම් ගනුදෙනුවකට හෝ ගනුදෙනු පෙළකට එළැඹීමට එයට තහනම් කරමින්; හෝ

(ඇ) එයට මතු අනාගත ව්‍යාපාර කටයුතු අයැද සිටීමේ අවස්ථාවන් තහනම් කරමින්

විධානයන් පැනවිය හැක.

**ලියාපදිංචි ලේඛනයෙන් කපා හැරීම**

30. (අ) බලපත්‍රලාභියා හට බලයලත් තැනැත්තෙකු ලෙස සුදුසුකම් ලබා දෙමින් නිකුත් කරන ලද බලපත්‍රය මෙම නියෝගයන්හි IV කොටස ප්‍රකාර අලුත් කොට නොමැති අවස්ථාවන්හිදී හෝ කොමිෂන් සභාව විසින් 26 හෝ 28 නියෝග යටතේ බලපත්‍රලාභියා හට බලයලත් තැනැත්තෙකු වශයෙන් සුදුසුකම් ලබා දෙමින් නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරන අවස්ථාවන්හිදී, (යම් බදු ගිවිසුම් වේනම් ඒවාද ඇතුළත්ව) බලයලත් තැනැත්තා හා කොමිෂන් සභාව අතර ඇති කරගත් සියලු ආකාර ගිවිසුම් අවසන්

වනු ඇති අතර, බලයලත් තැනැත්තාගේ නම කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි ලේඛනයෙන් කපා හැරිය යුතුය. ගිවිසුම් අවසන් කරනු ලැබ බලයලත් තැනැත්තෙකුගේ නම ලියාපදිංචි ලේඛනයෙන් කපා හැරි විටෙකදී, කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ හා එහි සිටව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා එම බලයලත් තැනැත්තා හට පැවති සුදුසුකම නතර වේ.

(ආ) බලයලත් තැනැත්තා ලියාපදිංචි ලේඛනයෙන් කපා හරිනු ලැබ ඇත්තේය යන කරුණ නොසලකා, බලයලත් තැනැත්තා එම බලයලත් තැනැත්තාට අදාළ සියලු හිමිකම්, ණය, බැරකම් හා වගකීම් සඳහා වගකිව යුතු වනු ඇති අතර, බලයලත් තැනැත්තාගේ සෑම නිර්මාතෘක, සාමාජික, හවුල්කාර, අධ්‍යක්ෂ හා කොටස් හිමි පුද්ගලයෙකුගේම බැරකම නොකඩවා පවත්නා අතර බලයලත් තැනැත්තා කොමිෂන් සභාව විසින් බලපත්‍රගත හා නියාමනය වන අයෙකු වන්නේ නම් සිදු කෙරෙන ලෙස තවදුරටත් බලගැන්විය හැක.

(ඇ) ඉහත 30 (ආ) රෙගුලාසියෙහි පොදුබව නොසලකා, බලයලත් තැනැත්තා ලියාපදිංචි ලේඛනයෙන් කපා හරිනු ලැබ ඇත්තේය යන කරුණ නොතකා, බලයලත් තැනැත්තා විසින් පනත යටතේ ගෙවිය යුතුව පවත්නා සියලු ගාස්තු, බලපත්‍ර ගාස්තු හා දඩ මුදල් සම්බන්ධ වගකීම නොකඩවා දරනු ලැබිය යුතුය; තවද, එම ගාස්තු, බලපත්‍ර ගාස්තු හා දඩ මුදල් බලයලත් තැනැත්තාගේ වත්කම් හා සම්බන්ධව කෙරෙන අන් සියලු හිමිකම් ප්‍රකාශයනට වැඩි ප්‍රමුඛත්වයක් ගත යුතුය.

## VII කොටස
### *අධිභාර හා දඩ මුදල්*

31. (අ) නිශ්චිතව පනවා ඇති කාල සීමාව තුළ බලපත්ලාභියා වෙත බලයලත් තැනැත්තෙකු වශයෙන් වූ සුදුසුකම් ලබා දෙමින් බලපත්‍රය අලුත් කිරීමට යම් බලයලත් තැනැත්තෙකු අපොහොසත් වන්නේ නම්, හෝ නිශ්චිතව පනවා ඇති කාල සීමාව තුළ යම් කරුණක් පිළිබඳ යම් අයදුම්පතක්, විස්තරයක්, ප්‍රකාශනයක්, ලේඛනයක්, විස්තර වාර්තාවක් හෝ නිවේදනයක් ගොනු කිරීමට අපොහොසත් වන්නේ නම් හා එම පැහැර හැරීම හේතුකොට පනත යටතේ වරදක් සිදුකර ඇති විටදී, කොමිෂන් සභාව විසින්, යෝග්‍ය යැයි හඟින්නේ නම්, පනතේ 68 හා 69 වගන්ති ප්‍රකාර එම වරද සම්බන්ධයෙන් බලයලත් තැනැත්තාට හෝ බලයලත් තැනැත්තාගේ පාලක හෝ කළමනාකරණ මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම වෙනුවට, හෝ දැනටමත් එවන් අධිකරණ ක්‍රියාමාර්ගයන් ආරම්භ කොට ඇත්තේ නම්, එම අධිකරණ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයාම වෙනුවටබලයලත් තැනැත්තාට හෝ බලයලත් තැනැත්තාගේ පාලක හෝ කළමනාකරණ මණ්ඩලයේ යම් සාමාජිකයෙකු ට වරදේ සංයුතිය අනුව කොමිෂන් සභාවට සුදුසු යැයි හැඟී යා හැකි ප්‍රමාණයක දඩ මුදලක් පැනවිය හැක. කොමිෂන් සභාව විසින් එසේ ලබාගනු ලබන ඕනෑම දඩ මුදලක් මෙම පනත යටතේ ස්ථාපනය කරනු ලබන අරමුදලට බැර කළ යුතුය.

(ආ) කොමිෂන් සභාව විසින් යම්කිසි වරදක සංයුතිය තුළ 31(අ) නියෝගය යටතේ දඩ මුදලක් වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් පිළිගෙන ඇති අවස්ථාවකදී එම වරද සම්බන්ධයෙන් බලයලත් තැනැත්තා හෝ බලයලත් තැනැත්තාගේ පාලක හෝ කළමනාකරණ මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට එරෙහිව අධිකරණමය ක්‍රියා මාර්ග නොගත යුතු අතර, දැනටමත් එවන් ක්‍රියාමාර්ග ගෙන ඇත්තේ නම්, ඉදිරියට නොපැවැත්විය යුතුය.

(ඇ) 31(අ) නියෝගයේ විවිධිවිධාන යටතේ පනවල ලද දඩ මුදලක් නොගෙවා පවත්නා විටදී, පනතේ 70 වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

## VIII කොටස
### *ආකෘති පත්‍ර හා නිවේදන*

32. (අ) පනත යටතේ හා කොමිෂන් සභාව විසින් නිර්දේශ කළ හැකි මෙම නියෝග යටතේ ගොනුකළ යුතුවන යම් අයදුම්පතක්, විස්තරයක්, ප්‍රකාශනයක්, ලේඛනයක්, විස්තර වාර්තාවක් හෝ නිවේදනයක් ආකෘති පත්‍රය තුළම අන්තර්ගත හෝ කොමිෂන් සභාව විසින් ලබාදී ඇති යම් මඟ පෙන්වීම්, උපදෙස්, මාර්ගෝපදේශ හෝ අවශ්‍යතාවයන් හා අනුගතව සම්පූර්ණ කළ යුතුවන අතර, කොමිෂන් සභාව විසින් කලින් කලට පවත්වාගෙන යනු ලබන විද්‍යුත් ඉදිරිපත් කිරීමේ පද්ධතිය උපයෝගයෙන් කොමිෂන් සභාව වෙත භාරදිය යුතුය. එවන් විද්‍යුත් ඉදිරිපත් කිරීමේ පද්ධතියක් නොමැති අවස්ථාවන්හිදී හෝ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි විශේෂ තත්ත්වයන් යටතේ, ආකෘති පත්‍රය කොමිෂන් සභාව විසින් උපදෙස් ලබාදෙන අයුරු අතින් ගොනු කළ හැක.

(ආ) කොමිෂන් සභාව වෙත ගොනුකරනු ලබන යම් කරුණක් සම්බන්ධ එවන්අයදුම්පතක්, විස්තරයක්, ප්‍රකාශනයක්, ලේඛනයක්, විස්තර වාර්තාවක් හෝ නිවේදනයක්:

i. පැහැදිලිව කියවිය හැකි විය යුතු අතර, විද්‍යුත් විධික්‍රමයන්ද ඇතුළත්ව ස්පර්ශ කළ හැකි ආකෘති පත්‍රයෙකින් නැවත ඉදිරිපත් කළ හැකි විය යුතුය;

ii. අදාළ තැන්හි, ආකෘති පත්‍රය තුළ දක්වා ඇති පුද්ගලයාගේ හෝ පුද්ගලයන්ගේ අත්සන් හා ආකෘති පත්‍රය අත්සන් කරන ලද දිනය ඇතුළත් විය යුතුය;

iii. සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබිය යුතුය; හා

iv. කොමිෂන් සභාවට පිළිගත හැකි ආකාරයකින් සපයා දිය යුතුය.

(ඇ) කොමිෂන් සභාව වෙත භාරදෙන ලද ලේඛනයේ පිටපතක් වසර දහය (10) ක කාලයක් පුරා බලයලත් තැනැත්තන් විසින් තබාගත යුතුය.

(ඈ) පනත හෝ වෙනයම් ලිඛිත නීතියක් තුළ කොමිෂන් සභාවට අයදුම්පතක්, විස්තරයක්, ප්‍රකාශනයක්, ලේඛනයක්, විස්තර වාර්තාවක් හෝ නිවේදනයක් ගොනු කිරීමේ අවශ්‍යතාවයක් පනවා ඇති අවස්ථාවන්හිදී, එම අයදුම්පත, විස්තරය, ප්‍රකාශනය, ලේඛනය, විස්තර වාර්තාව හෝ නිවේදනය, පනත තුළ හෝ වෙනත් ලිඛිත නීතියක් තුළ හෝ මෙම නියෝග තුළ අන් තැනෙක කාල සීමාවක් ප්‍රකාශ කොට නොමැති අවස්ථාවන්හිදී, නිවේදනය අදාළවන සිදුවීම සිදුවූ දිනයෙන් දින තිහ (30)ක් ඇතුළත ගොනු කළ යුතුය.

## IX කොටස
*අර්ථ නිරූපණය*

33. (අ) මෙම නියෝගයන්හි අවශ්‍යතාවය සඳහා:

"පනත" යන්නෙන් 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත අදහස් වේ; සහ
"ගාස්තු නියෝග" යන්නෙන් කලින් කලට සංශෝධනය කරන ලද 2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් (ගාස්තු) ලියාපදිංචි කිරීමේ හා බලපත්කරණ නියෝග අදහස් වේ.

(ආ) උක්ත අර්ථ නිරූපණය කොට නොමැති හා 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත තුළ අර්ථ නිරූපිත, මෙම නියෝග තුළ භාවිතවන යෙදුමක් වේනම් එමගින් 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත තුළ අන්තර්ගත අර්ථයම අදහස් වනු ඇත.

(ඇ) මෙම නියෝග තුළ යම් විධිවිධානයක් මගින් 'ලිඛිත' සන්නිවේදනයක්, නිවේදනයක්, ගිවිසුමක් හෝ වෙනයම් ලේඛනයක් පිළිබඳ සඳහන් කරන්නේ නම්, එවිට, පටහැනි අදහසක් පෙනී යන්නේ නම් විනා, එමගින් පැහැදිලිව කියවිය හැකි හා භාවිත කර ඇති මාධ්‍ය කවරේ වුවද කඩදාසියක ප්‍රතිනිර්මාණය කළ හැකි යන්නක් අදහස් කෙරේ. ලේඛනයට අදාළ ප්‍රකාශයන් ඒ අනුව අර්ථ නිරූපණය කළ යුතුය.

(ඈ) මෙම නියෝගවල සිංහල හා දෙමළ පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතුය.

## උපලේඛනය I

*කොළඹ වරාය නගරය බල ප්‍රදේශයේ හා එහි සිට ව්‍යාපාර කටයුතුවල යෙදීමේ බලපත්‍රයක් සඳහා වූ අයදුම්පත*

**උපදෙස්:**

(1) අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා විද්‍යුත් පද්ධතියක් සකස්වන තුරු, නිශ්චිතව පනවා ඇති ලේඛන හා යෝජිත ව්‍යාපාරයට අදාළ ලේඛනමය සාක්ෂිද සමගින්, සම්පූර්ණ කරන ලද අයදුම්පත අයදුම්පත් ගාස්තුද සමගින් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) තවද, අයදුම්කරුවන් විසින් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් මූලික සමාලෝචනයක් සිදු කරනු පිණිස සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආකෘති පත්‍රයෙහි හා සහාය ලේඛනවල මෘදු පිටපතක්ද (අයදුම්පත් ගාස්තුව ගෙවූ බවට සනාථ කරන ලේඛනද සමගින්) විද්‍යුත් තැපෑලෙන් applications@portcity.gov.lk ලිපිනයට යොමු කළ යුතුය.

(3) විද්‍යුත් පද්ධතිය සකස් වූ පසු, අයදුම්පත විද්‍යුත් පද්ධතිය තුළ සපයා දී ඇති උපදෙස් ප්‍රකාර යොමු කළ හැක.

(4) අයදුම්පත් ගාස්තුව කොමිෂන් සභාව විසින් කලින් කලට පළ කරනු ලැබිය හැකි ආකාරයෙන් ගෙවිය හැක.

